www.agaram.lk

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2018

| 5 ශ්‍රේණිය | මව්බස | කාලය : පැය 01 මිනිත්තු 30 |
|---|---|---|

නම .................................................................................................................................

(01). පහත දැක්වෙන ඡේදය හොඳින් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පස සෝදා යාම නිසා සමහර ගසක මුල් අපට පෙනෙන්නේ අඬු විහිදා ගත් දැවැන්ත සතෙකු මෙනි. පහුරේ පැලෙහි බත් මුල් තිබුණ ද මට තව ම බඩගිනි නැහැ. වෙලාව දවල් දොළහ පසු වී ඇතැයි හැඟෙන්නේ මුදුන් ඉර බටහිරට හැරුණු හෙයිනි.

"දවල් වුණා, විජේපාල බත් කෑව නං" සේතන් අයියා කීවේ ය. "පස්සේ කනවා." දෙතුන් වරක් පෙරළත්ත කළ සේතන් අයියා "එහෙනං අපි තුන් දෙනාම කමු" යි කීවේය. පතුරු ගසන ලද කොළපත්වල බැඳ තිබූ ඒ බත් ගෙඩි තුනම එක ප්‍රමාණයේ විය.

1. සේතන් අයියා විජේපාලට කීවේ කුමක් ද? ..........................................................................
2. මෙහි සඳහන් උපමාව සොයා ලියන්න. ..........................................................................
3. බත් ගෙඩි බැඳ තිබුණේ කුමක ද? ..........................................................................
4. ප්‍රථම පුරුෂ අතීත කාල ඒකවචන ක්‍රියාපදයක් සොයා ලියන්න. ..............................................
5. "පැල" යන පදයේ බහු වචන පදය ලියන්න. ..........................................................................
6. "දැවැන්ත" යන්නෙහි අදහස ලියන්න. ..........................................................................
7. "අපි තුන් දෙනාම බත් කමු" යන වැකිය අතීත කාලයට හරවා ලියන්න.

   ..........................................................................................................................
8. 'කොළපත' සකස් කර ගැනීමට ගනු ලබන්නේ කුමන ශාකයේ කොටසක් ද? ...............................

(ලකුණු 08)

(02). නිවැරදිව ලියා ඇති වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

1. i. විවිධප්ප්‍රසංගය ii. විවිදප්ප්‍රසංගය iii. විවිධප්‍රසංගය iv. විවිධප්‍රශංගය
2. i. පාශාන ii. පාෂාන iii. පාසාන iv. පාෂාණ (ලකුණු 02)

(03). පහත දී ඇති එක් එක් වගන්තිය සඳහා ගැළපෙන වචනය වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.
(යමි , ගියෙමු , ළමයි , ළමයා , ගියෙහු , ගියෙහි)

1. උත්තම පුරුෂ ඒකවචන වර්තමාන කාල ක්‍රියා පදයකි. ..............................................................
2. මධ්‍යම පුරුෂ බහුවචන අතීත කාල ක්‍රියා පදයකි. ..............................................................
3. ප්‍රථම පුරුෂ ඒකවචන නාම පදයකි. .............................................................. (ලකුණු 03)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

(04). පහත පදවල අදහස පැහැදිලි කරන්න.

1. තිරසර ..........................................................................
2. මලක්කන් ..........................................................................
3. ඇඹුල .......................................................................... (ලකුණු 03)

(05). කෙටි යෙදුම විස්තර කර ලියන්න.

1. ප්‍රා.ලේ.කා. ...................................................................
2. ස.ණ.ස. ...................................................................
3. රා.සේ.පි. ................................................................... (ලකුණු 03)

(06). තනිපද ලියන්න.

1. සිනා උපදවන ........................................................
2. ඝන බවට පත් ජලය ........................................................
3. පොත්පත් කියවන්නා ........................................................ (ලකුණු 03)

(07). පහත දැක්වෙන යෙදුම්වල අදහස ලියා දක්වන්න.

1. ඉහේ මලක් පිපුණා ........................................................
2. රජ ගෙදර පරවියා ........................................................
3. ඇහැ ගහ ගෙන ඉන්නවා ........................................................ (ලකුණු 03)

(08). පිරුළුවල හිස්තැන් සම්පූර්ණ කරන්න.

1. කළුවා ...................................... ගියා වගෙයි.
2. කොහොඹ ගහට ...................................... වැල ගියා වගෙයි.
3. ගඟෙන් දිය බී ...................................... ආවඩන්නා සේ. (ලකුණු 03)

(09). පහත සඳහන් වචනවලට සමාන තේරුම් දෙන වචන ලියන්න.

1. උදව්ව ........................................................
2. හඬ ........................................................
3. ශෝකය ........................................................ (ලකුණු 03)

(10). තිත් ඉරිමත ගැළපෙන පදය යොදා යුගල පද සම්පූර්ණ කරන්න.

1. ................ කඩම්
2. අවවාද ................
3. ................ පිටි
4. ගනු ................ (ලකුණු 04)

Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(11). පහත දී ඇති කවියේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

මවුපිය දෙගුරුන් හා වැඩිහිටියන්
දරුවන් දැරියන් වෙත දෙන ඔවදන්
සිත තුළ රඳවා ගෙන හද බැතියෙන්
............................................................................................................ (ලකුණු 02)

(12). පහත දී ඇති යෙදුම්වල උපමාව, උපමේය, සමාන බව හඟවන පදය වශයෙන් කොටස් කර වගුව පුරවන්න.

1. ග්‍රහලෝකාගාරයේ වහල මුනින් නැවූ නැඹිලියක් වගෙයි.
2. බැස යාමට ආසන්න වූ හිරු ගිනි බෝලයක් වැනිය.

| උපමාව | උපමේය | සමාන බව හඟවන පදය |
|---|---|---|
| | | |
| | | |

(ලකුණු 06)

(13). පහත සඳහන් වැකි විරාම ලකුණු යොදා නැවත ලියන්න.

1. අපොයි පණ්ඩිතයා ඔයා කොහොමද දන්නේ තරංග හරස් කපමින් විස්මය පළ කළේය
..........................................................................................................................................
2. දැන් ඉතින් හරි ජයසේකර සැහැල්ලුවෙන් කීවේ ය
..........................................................................................................................................(ලකුණු 04)

(14). පහත සඳහන් වාක්‍ය බහුවචනයට හරවා ලියන්න.

1. ගොවියා කමතේ ගස් සෙවණේ වාඩි වුණේ ය.
..........................................................................................................................................
2. ගායිකාව ගී ගයමින් වේදිකාවේ නැටුවා ය.
..........................................................................................................................................
3. මී මැස්සා රොන් සොයමින් මලින් මලට පියඹයි.
..........................................................................................................................................(ලකුණු 06)

(15). පහත සඳහන් වාක්‍ය ස්ත්‍රී ලිංගයට හරවා ලියන්න.

1. මුවා වතුර බීමට සෙමෙන් දිය වළට පැමිණියේ ය.
..........................................................................................................................................
2. පන්ති භාර ගුරුතුමා නිතර ම අපට ඉදිරියට යාමට මඟ පාදයි.
..........................................................................................................................................
3. නිවේදකයා අලුත් අවුරුදු චාරිත්‍ර ගැන සම්පූර්ණ විස්තරයක් කළේ ය.
..........................................................................................................................................(ලකුණු 06)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

(16). හිස්තැනට සුදුසු ක්‍රියා පදය තෝරා යටින් ඉරක් අඳින්න

1. ආච්චී ශේන්යාට මලක් තෑගි ............................ (කළේ ය / කළා ය).
2. සුබෝධනී ගුරුතුමිය වැඩසටහන නැරඹූ සියලු දෙනාට ස්තූති ........................ (කළෝ ය / කළා ය).
3. මාර්ටින් වික්‍රමසිංහ ශූරීහු අපේ ගම කෘතිය රචනා ............................ (කළේ ය / කළ හ).
4. රාත්‍රී අහසේ තාරකා බොහොමයක් පායා ............................ (තිබුණ හ / තිබුණි).
5. නැන්දා ද මම ද පොළට ............................ (ගියෙමු / ගියෙමි).
6. ඇතමෙක් අපට බොරු ............................ (නොකියයි / නොකියති).
7. අක්කාත් අයියාත් තාත්තාත් ගොවිපළ බැලීමට ............................ (ගියේ ය / ගියෝ ය).
8. තාත්තා සමග නංගී පන්සලට ............................ (ගියෝ ය / ගියා ය).
9. වෘක්ෂයෝ මහා සුළඟට කඩා ............................ (වැටුණා හ / වැටුණේ ය).
10. ගුරුවරු ද විදුහල්පතිතුමා ද වීදුරු ගැන වැඩසටහනට ප්‍රශංසා ............................ (කරයි / කරති).

(ලකුණු 10)

(17). පහත කොටු තුළ ඇති වචනවලින් එක බැගින් යොදා ගනිමින් අර්ථවත් වාක්‍ය තුනක් සකසන්න. එක වචනයක් යොදා ගත හැක්කේ එක් වතාවක් පමණි.

| | | | |
|---|---|---|---|
| සිසුන්ට | අරුණ | පරිසරයක | ගුරුවරු |
| පාසලට | කරති. | යයි. | උදෙන් ම |
| රමණී ය | පිහිටා ඇත. | සිසුහු | අපේ පාසල |
| කතන්දරයෙන් | නිතර | අවවාද | කියවති. |

1. ............................................................................................................................
2. ............................................................................................................................
3. ............................................................................................................................

(ලකුණු 06)

(18). පහත සඳහන් පද යොදා අර්ථවත් වැකි නිර්මාණය කරන්න.

1. කළ - ........................................................................................................
2. වනය - ........................................................................................................
3. පහණ - ........................................................................................................
4. වළ - ........................................................................................................
5. දන - ........................................................................................................

(ලකුණු 10)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

(19). නිවැරදිව පද බෙදා නැවත ලියන්න.

හිරුපායනවිටවැටෙනසෙවණැල්ලපාදයෙන්මැනඑමපියවරගණනඅනුවවේලාවසැදීමඅපරටේපැරණි කාලයේසිටපැවතඑනසම්ප්‍රදායකි.

.................................................................................................................................................

.................................................................................................................................................(ලකුණු 03)

(20). පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 5කට නොඅඩුව අර්ථවත් වාක්‍ය හයක් ගොඩනගන්න. උක්ත ආඛ්‍යාත සම්බන්ධය, නිවැරදි අක්ෂර වින්‍යාසය පිළිබඳව සැලකිලිමත් විය යුතුයි.

1. දුටුගැමුණු රජතුමා
2. සඳපායා ඇති රාත්‍රියක්
3. “උම්බෑ ............ උම්බෑ ........ ඇතින් ඇසෙන ඒ හඬ මගේ වසු පැටියාගේ බව දැනගත් මම වත්ත පහළට දුව ගොස් ළිඳ තුළ එබී බැලුවෙමි. එහෙත් ඌ ළිඳ තුළ දක්නට නොලැබුණි. ..........” එතැන් සිට ඉදිරියට සිදුවිය හැකි දේ නිර්මාණාත්මකව ගොඩනගන්න. (ලකුණු 12)

4. .................................................................................................................................................
.................................................................................................................................................
5. .................................................................................................................................................
.................................................................................................................................................
6. .................................................................................................................................................
.................................................................................................................................................
7. .................................................................................................................................................
.................................................................................................................................................
8. .................................................................................................................................................
.................................................................................................................................................
9. .................................................................................................................................................
.................................................................................................................................................

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk